අනුර කුලසේකර
ගරු ලේකම්
ධම්මදීප භාවනා සහ සංස්කෘතික සංවිධානය'

# මහානාහිමි, අනුනාහිමි, නාහිමි අභිවන්දනා'

සියවස් විසිහයක් පුරා අඛණ්ඩව පවතින යම් සමාජ සංවිධානයක් වේ නම් ඒ බෞද්ධ සංඝ ශාසනයයි. සිද්ධාර්ථ ගෞතම බුදුපියාණන් වහන්සේ විසින් විනය ප්‍රඥප්තීන් නමැති ශක්තිමත් පදනම මත ගොඩනගන ලද සංඝ ශාසනය, උතුම් බුද්ධ ශාසනය සුරැකීම සඳහා ජීවිත පරිත්‍යාගයෙන් කරන ලද කැපකිරීම් වචනයෙන් විස්තර කළ නොහැකිය. සම්බුද්ධ පරිනිර්වාණයෙන් පසු බුද්ධ දේශිත ශ්‍රී සද්ධර්මය චිරාත් කාලයක් පවතිනු පිණිස ආරක්ෂා කරගනිමින්, විවිධ අභියෝග සහ බාධකවලට නොසැලී මුහුණ දෙමින් සම්බුද්ධ ශාසනයේ චිරස්ථිතිය වෙනුවෙන් භික්ෂූන් වහන්සේලා විසින් සිදු කරන ලද අනුපමේය මෙහෙවර ගෞරව භක්තිප්‍රණාම පූර්වකව සැමකල්හි සිහිපත් කළ යුතු වෙමු.

බුදුරදුන් ධරමාන අවධියේ පවා විවිධ විශේෂ දක්ෂතා ඇති ශ්‍රාවක භික්ෂූන් වහන්සේලාට අගතනතුරු ප්‍රදානය කළ බව අසූමහා ශ්‍රාවක චරිතයන් මෙන් ම ශාසන ඉතිහාසය පිරික්සීමෙන් මනා ව පැහැදිළි වෙයි. එම සම්ප්‍රදාය මිහිඳු මහරහතන් වහන්සේගේ ලංකාගමනයෙන් ඇරඹි ලාංකීය භික්ෂු ශාසනය තුළ ද ක්‍රියාත්මක විය. අනුරාධපුර යුගයේ සිට මහනුවර යුගය දක්වා කලින් කල වැඩ විසූ සංඝරාජ හිමිවරුන්, නායක හිමිවරුන් පිළිබඳ ඓතිහාසික තොරතුරු අපට හමුවේ. මහනුවර යුගයේ අභාවයට ගොස් තිබූ උපසම්පද පුණ්‍යකර්මය; සියම් දේශයෙන් (තායිලන්තය) උපාලි හිමියන් ප්‍රමුඛ භික්ෂූන් වහන්සේලා පිරිසක් මෙරටට වැඩමවා වර්තමානයේ මහනුවර මල්වතු මහාවිහාරයට අයත් පෝය මළු විහාරයේ දී යළි ආරම්භ කරන්නට යෙදුණි. එතැන් පටන් එම භික්ෂු පරපුර හැඳින්වූයේ 'මහාවිහාරවංශික ස්‍යාමෝපාලි මහා නිකාය' නමිනි. එකී ශාසනික පුනරුදයට පුරෝගාමී වූ වැලිවිට පිණ්ඩපාතික අසරණ සරණ සරණංකර සංඝරාජ මාහිමිපාණන් වහන්සේට කීර්ති ශ්‍රී රාජසිංහ මහරජතුමන් විසින් සංඝරාජ පදවිය පිරිනැමීමෙන් ඇරඹුණු ශාසනික තනතුරු ප්‍රදානය කිරීමේ සම්ප්‍රදාය මල්වතු අස්ගිරි උභය මහාවිහාරයන්හි මෙන් ම අනෙකුත් ශ්‍රී ලාංකීය සියලු ම නිකායයන්හි අද දක්වාත් අඛණ්ඩව පවත්වාගෙන එනු ලබයි.

මීට දශක දෙකකට පමණ පෙර ඩැන්ඩිනොන්හි ආරම්භ වූ ධම්මදීප භාවනා මධ්‍යස්ථානය; මෙල්බර්න් නුවර වාසය කරන ශ්‍රී ලාංකිකයන් වෙනුවෙන් ඉටුකරන ජාතික, ආගමික හා සංස්කෘතික සේවාව ඉතා විශාලය. එහිලා විහාරාධිපති ශාස්ත්‍රපති පූජ්‍ය අකරවිට සංඝානන්ද ස්වාමීන්ද්‍රයන් වහන්සේ දිවා රෑ නොබලා විහාරස්ථානයට පැමිණෙන සියලු දෙනාගේ ආගමික අවශ්‍යතාවන් ඉටුකිරීම, විහාරස්ථානයේ වත්මන් දියුණුවේ මූලික පදනම බව විශේෂයෙන්ම සඳහන් කළ යුතුය. විහාරස්ථානයට වැඩම කරවන ගෞරවණීය මහාසංඝරත්නය, නිරන්තරයෙන් දායක පින්වතුන් කෙරෙහි කරුණාවෙන් දෙලොව දියුණුවට මග පෙන්වමින් ඉටුකරන ශාසනික සේවය ඉමහත්ය. ඩැන්ඩිනොන් විහාරස්ථානයෙන් සිදුවන ආගමික සහ ජාතික සේවාවන් වඩාත් පුළුල් කිරීමේ අරමුණින් පැකෙනම් ප්‍රදේශයේ අක්කර දහයක භූමියක් මිලට ගෙන නව විහාරස්ථානයක් ඉදිවෙමින් පවතින බව ද සතුටින් සිහිපත් කරමු.

පූජ්‍ය අකරවිට සංඝානන්ද අපේ ලොකු හාමුදුරුවන් වහන්සේ ලොකු කුඩා කාටත් එකසේ කරුණාවන්තය. උන්වහන්සේ තුළින් අප දුටු විශේෂතා රැසකි. ඒවා අතර විවිධ, බාධක අභියෝග මැද නොසැලී සිනාමුසු මුහුණින් සිය සේවාවන් නොපිරිහෙළා ඉටු කිරීම, විහාරස්ථානයට ආගමික කටයුතු සඳහා පැමිණෙන ඕනෑම අයෙකුට හැකි උපරිමයෙන් එම කාර්යයන් ඉටු කර දීම, එක්වරක් පැමිණි අයෙකු වසර ගණනාවකට පසුව පැමිණියත් නම කියා ආමන්ත්‍රණය කර සුවදුක් විමසීම, විහාරස්ථානයට ආගන්තුකව පැමිණෙන මහාසංඝරත්නයට සියතින්ම ගිලන්පස සකස් කර ඉතාම හිතෛෂී ලෙස පිළිගැන්වීම, ගිහි අයෙකුට වුව ද මහත් හිතවත්කමින් ආහාරපානාදියෙන් සංග්‍රහ කිරීම, සිය පෞද්ගලික සෞඛ්‍ය තත්ත්වය පිළිබඳව නොසලකා වෙහෙස නොබලා ආගමික ජාතික කාර්යයන් ඉටුකිරීම යනාදිය විශේෂයෙන් සඳහන් කළ හැකිය. උන්වහන්සේ ශාසනික බ්‍රහ්මචර්යාවන් ඉතාමත් ගරුකොට සලකන සුපේශල, ශික්ෂාකාමී ආදර්ශවත් යතිවරයාණන් වහන්සේ නමක බව ඇසුරු කරන, දන්නා හඳුනන සැම භික්ෂූන් වහන්සේ නමක්ම අවිවාදයෙන් පිළිගන්නා කරුණකි.

ශ්‍රී ලංකාවේ මාළිගාතැන්න විවේක සේනාසනය, ඩැන්ඩිනොන් සහ පැකෙනම් භාවනා මධ්‍යස්ථාන සහ ධම්මදීප දහම් පාසල තුළින් පූජ්‍ය අකරවිට සංඝානන්ද ස්වාමීන්ද්‍රයන් වහන්සේ සිදු කරන පරහිතකාමී, අතුපුදුර ලෝකශාසනික සේවාවන් පිළිබඳ ප්‍රසාදයට පත් මහාවිහාරවංශික ස්‍යාමෝපාලි මහානිකායේ අස්ගිරි මහාවිහාර පාර්ශ්වයේ අතිපූජ්‍ය මහානායක ධුරන්ධර වරකාගොඩ ශ්‍රී ඤාණරතනාභිධාන මහා ස්වාමීන්ද්‍රයාණන් වහන්සේ ප්‍රධාන සංඝ සභාව මගින් 'විමලකීර්ති ශ්‍රී දේවානන්ද' යන ගෞරව නාමය සහිතව ඕස්ට්‍රේලියාවේ ප්‍රධාන සංඝනායක ධුරයට පත්කරන්නට යෙදීම දායකකාරකාදී සියලු දෙනාට ඉමහත් සතුටට හා



ප්‍රසාදයට හේතුවකි. පිදිය යුත්තන් පිදීම මංගල කාරණයක් බව බුදුරජාණන් වහන්සේ දේශනා කර ඇත. පූජ්‍ය අකරවිට සංඝානන්ද ස්වාමීන්ද්‍රයන් වහන්සේ මෙම තනතුරට සපුරාම යෝග්‍ය බව ගිහි පැවිදි සියලු දෙනාගේ පිළිගැනීමයි. තනතුරු ලාභයන් ගැන කිසිදු අපේක්ෂාවක් නොමැති අපේ සංඝානන්ද ලොකු හාමුදුරුවන් වහන්සේ වෙත දැක්වූ උපහාරය, ගෞරවය පිළිබඳව අපගේ පුණ්‍යානුමෝදනා පූර්වක ස්තූතිය අස්ගිරි මහාවිහාරයට පුද කරනු කැමැත්තෙමු.

ඕස්ට්‍රේලියාවේ ප්‍රධාන සංඝනායක පදවියට පත් කිරීමෙන් අනතුරුව ශ්‍රී ලංකාවේ සිට ආපසු වැඩම කළ පූජ්‍ය අකරවිට සංඝානන්ද ස්වාමීන්ද්‍රයන් වහන්සේ ඩැන්ඩිනොන් සහ පැකෙනම් විහාරස්ථානයන්හි දායක සභාවන් විසින් මෙල්බර්න් ගුවන් තොටුපළේදී මහත් හරසරින් පිළිගෙන විහාරස්ථානයට වැඩම කරවන ලදී. එපමණකින් නොනැවතී තත් දායක සභාවන්හි සංවිධායකත්වයෙන් අභිනව නාහිමියන්ට උපහාර පිදීමේ මහෝත්සවය 2016 නොවැම්බර් මස 01 දින Pakenham Cardinia Cultural Center ශාලාවේදී පැවැත්වෙන බව සියලු දෙනා වෙත ඉමහත් සතුටින් දැනුම් දෙමු.

මෙම උපහාර මහෝත්සවයේ මුලසුන හොබවන්නේ මහාවිහාරවංශික ස්‍යාමෝපාලි මහානිකායේ අස්ගිරි මහා විහාර පාර්ශ්වයේ මහානායක ධුරයට අභිනවයෙන් පත් වූ මහනුවර, ශ්‍රී ජයගිරි විජයසුන්දරාරාම විහාරද්වයාධිපති සහ ඓතිහාසික බදුලු මුතියංගන රාජමහා විහාරාධිපති, වරකාගොඩ ධම්මසිද්ධි ශ්‍රී පඤ්ඤානන්ද ඤාණරතනාභිධාන අතිපූජ්‍ය මහානායක මාහිමිපාණන් වහන්සේ ය. එසේම පූජ්‍ය අකරවිට සංඝානන්ද අප නායක ස්වාමීන්ද්‍රයන් වහන්සේගේ අනුශාසනා සහ මගපෙන්වීම පරිදි අභිනව පදවිප්‍රාප්ත අස්ගිරි මහා නාහිමියන්ටත්, අස්ගිරි මහාවිහාර පාර්ශ්වයේ අභිනව අනුනායක ධුරන්ධර ශ්‍රී ලංකා භික්ෂු විශ්වවිද්‍යාලයේ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, කුරුණෑගල ඇත්කඳ රාජමහා විහාරාධිපති, දර්ශනපති පූජ්‍ය ආණමඩුවේ රතනපාල ශ්‍රී බුද්ධරක්ඛිත ධම්මදස්සාභිධාන අතිගරු අනුනායක ස්වාමීන්ද්‍රයන් වහන්සේටත්, ඓතිහාසික මහියංගණ රාජමහා විහාරාධිපති ධුරයට අභිනවයෙන් පත් වූ මහෝපාධ්‍යාය උරුළැවත්තේ ධම්මසිද්ධි ශ්‍රී අත්ථදස්සි ධම්මරක්ඛිතාභිධාන අස්ගිරි මහාවිහාර පාර්ශ්වයේ ජ්‍යෙෂ්ඨ කාරක සංඝසභික නායක ස්වාමීන්ද්‍රයන් වහන්සේටත් උපහාර පිදීමටද මෙම මහෝත්සවයේදී කටයුතු සංවිධානය කර ඇත.

අපගේ මතකයේ හැටියට මෙවන් සම්භාවනීය යතිවරයන් වහන්සේලා පිරිසක් එකවර මෙල්බර්න් නගරයට වැඩමවන පළමු අවස්ථාව මෙයයි. අස්ගිරි මහානාහිමියන්, අනුනාහිමියන් ඇතුළු අස්ගිරි මහාවිහාර සංඝ සභාවේ සම්භාවනීය මහාසංඝරත්නය සමග ශ්‍රී ලංකාවේ කීර්තිමත් මහසඟරුවනද මෙල්බර්න් සහ සිඩ්නි ශ්‍රී ලාංකීය විහාරස්ථානවල විහාරාධිපති නායක ස්වාමීන්ද්‍රයන් වහන්සේලාද මෙම අවස්ථාවට අපගේ ආරාධනයෙන් සහභාගි වෙති. ගිහි පාර්ශ්වය නියෝජනය කරමින් සමස්ත ලෝකවාසී බෞද්ධ ජනතාවගේ වන්දනාමානයන්ට පාත්‍ර වන ශ්‍රී දළදා වහන්සේගේ භාරකාරත්වය දරන මහනුවර ශ්‍රී දළදා මාළිගාවේ දියවඩන නිළමේ තැන්පත් ප්‍රදීප් නිලංග දෑල මැතිතුමන්ගේ සහභාගිත්වයද මෙම මහෝත්සවය වඩාත් සම්භාවනීයත්වයට පත්කරනු නොඅනුමානය. ගරු දියවඩන නිළමේතුමන් මෙල්බර්න් පුරවරයේ මෙවැනි උත්සවයකට සහභාගි වන පළමු අවස්ථාව මෙය බව අපගේ විශ්වාසයයි. මෙල්බර්න්හි ශ්‍රී ලංකා කොන්සල් ජනරාල් ඩබ්ලිව්. ජී. එස් ප්‍රසන්න මැතිතුමන් සහ අප නාහිමියන්ගේ චිරකාලීන කල්‍යාණ මිත්‍ර කැලණිය විශ්වවිද්‍යාලයේ සිංහල අධ්‍යයන අංශයේ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය දර්ශන රත්නායක මැතිතුමන් ඇතුළු සම්භාවනීය ප්‍රභූවරුන් රැසක් මෙම උපහාර මහෝත්සවයට සහභාගි වීමට නියමිතය.

උපහාර මහෝත්සවයට පෙර ඔක්තෝබර් 29 සහ 30 දෙදින තුළ ඓතිහාසික මහියංගණ රාජමහා විහාරයේ සිට වැඩමවනු ලබන සර්වඥ ධාතූන් වහන්සේලා ප්‍රදර්ශනයක් ඩැන්ඩිනොන් ධම්මදීප විහාරස්ථානයේ පැවැත්වීමටද නාහිමියන්ගේ අනුශාසනා මත කටයුතු සංවිධානය කර ඇත. සර්වඥ ධාතූන් වහන්සේලා වෙනුවෙන් දිනපතා විශේෂ බුද්ධ පූජාවන් මහත් හරසරින් සිදු කෙරෙනු ඇත. එසේම අභිනව පදවිප්‍රාප්ත නාහිමිවරුන් ඇතුළු සියලු දෙනාට සෙත් පතා ධම්මදීප දහම් පාසලේ මූලිකත්වයෙන් ඔක්තෝබර් මස 29 දින රාත්‍රී 8.30 සිට සර්වරාත්‍රික පරිත්‍රාණ ධර්මදේශනාවක් සහ පසුදින උදෑසන මහාසංඝයාහට දක්ෂිණාවක් ද පවැත්වේ. මේ සියලුම ආගමික උත්සව සඳහා ශ්‍රී ලංකාවෙන් වැඩම කරවනු ලබන අතිපූජ්‍ය අස්ගිරි මහානාහිමියන් ප්‍රධාන සම්භාවනීය මහාසංඝරත්නය සහභාගි වීම, මෙල්බර්න්හි වාසය කරන බෞද්ධ සැදැහැවතුන්ට පින්සිදු කර ගැනීමට කලාතුරකින් ලැබෙන ඉතාමත් සුවිශේෂී දුර්ලභ අවස්ථාවකි. එකවර, එක තැනකදී මෙවන් සම්භාවනීය මහාසංඝරත්නයක් දැකබලා ගැනීමට, දානමානාදිය පිරිනැමීමට, ගෞරව සත්කාරයන් සිදුකිරීමට ලැබීම අප සියලු දෙනාගේ වාසනාවකි. එම අවස්ථාව සැබැවින් ම උදාවූයේ පූජ්‍ය අකරවිට සංඝානන්ද ස්වාමීන්ද්‍රයන් වහන්සේ නිසා බැවින් මේ සියලු ශාසනික, ආගමික කාර්යයන්ගෙන් ජනිත වන පුණ්‍ය ශක්තියේ බලයෙන්ද, උතුම් රත්නත්‍රයේ ආශීර්වාදයෙන් ද උන්වහන්සේට ශතවර්ෂාධික කාලයක් නිදුක්ව නිරෝගීව වැඩ වෙසෙමින් තවතවත් ලෝකශාසනික සේවාවන් ඉටු කිරීමට ශක්තිය, ධෛර්යය, වාසනාව සැලසේවායි සියලුම සැදැහැවතුන් වෙනුවෙන් ශුභාශිංසනය කරමි.

මෙම දුර්ලභ, උතුම් පින්කම්වලට සහභාගි වීමෙන් පින් සිදු කරගන්නා ලෙස ඔබ සැමටද මහත් කරුණාවෙන් ආරාධනය කරමි.

Land for Sale

**Gampaha**

Quiet residential area in 47 Perches of land
with a old house off Church Road.
7 minutes to town.

Valued only for land Rs. 700,000 per Perch .

call : 0435879888 or
email : wskper56@gmail.com